රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි: 08/2012

මගේ අංකය: EST-9/DICIP/06/0199
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2012.12.10 දින

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

**<u>ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 8:1 ඡේදය යටතේ අසාධු ලේඛන ගත කිරීම සඳහා සැපයිය යුතු වාර්තා</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1976.09.01 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක: 216 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. අසාධු ලේඛන ගත කිරීම සඳහා අදාළ නිලධාරින් සම්බන්ධ තොරතුරු මීට අමුණා ඇති ආකෘතිය පරිදි සකස්කර රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමේදී, විනය නියෝගය සම්බන්ධයෙන් නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට ලබාදී ඇති කාලය අවසන් වීමෙන් පසුව පමණක් තොරතුරු ඉදිරිපත් කළයුතුය.

04. ඉහත උපදෙස් පිළිබඳව ඔබ පළාත් සභාවට අයත් සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට පියවර ගත යුතුය.

05. 1976.09.01 දිනැති අංක: 216 දරන ආයතන චක්‍රලේඛ ලිපිය මෙයින් අවලංගු කරමි.

පී.බී.අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**ආකෘති පත්‍රය** **රා.පරි.ව.ලිපි යොමු අංකය:-** EST-9/DICIP/06/0199

## ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 8:1 ඡේදය යටතේ අසාධු ලේඛන ගත කිරීම සඳහා වූ වාර්තාව

I. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/රාජකාරි ස්ථානය:-
II. මුලකුරු සමඟ නම:-
III. මුලකුරු වලින් හැඳින්වෙන නම:-
IV. ජාතික හැඳුනුම්පත් අංකය:-
V. පෞද්ගලික ලිපිනය:-
VI. තනතුර:-
VII. සේවය:-
VIII. පංතිය:-
IX. ශ්‍රේණිය:-
X. සේවයට බැඳුනු දිනය:-
XI. අසාධුලේඛනගත කිරීම සඳහා:-

| | හේතුව | අදාළ කොටුව ඉදිරියෙන් √ ලකුණ යොදන්න. | දිනය (කවදා සිටද යන්න) |
|---|---|---|---|
| i. | අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගන්වා ඇත්ද | | |
| ii. | සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්ද | | |
| iii. | සේවයෙන් පහකර ඇත්ද | | |
| iv. | සේවය අවසන්කර ඇත්ද | | |
| v. | තනතුර අතහැර ගොස් ඇත්ද | | |

XII. සේවයෙන් පහකළේ නම්/සේවය අවසන් කළේ නම් එයට හේතු:-
XIII. පළාත් රාජ්‍ය සේවයේ / මධ්‍යම රජයේ නිලධාරියෙක්ද යන වග:-

| | |
|---|---|
| සකස් කළේ | පරීක්ෂා කළේ |
| අත්සන:- | අත්සන:- |
| නම:- | නම:- |
| තනතුර:- | තනතුර:- |
| දිනය: - | දිනය:- |

.............................
(දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධාන)
දිනය:-
නිල මුද්‍රාව:-